## 12 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 10 වන සතිය - ජූලි 6 සිට 10 දක්වා

## නිපුණතා මට්ටම 6.12 - අන්තර්ජාල සේවය සපයන්නන් (ISPs) ගේ භූමිකාව සහ ගෘහස්ත ජාල අන්තර්ජාලයට සම්බන්ධ කිරීම සඳහා භාවිත කරන තාක්ෂණ ගවේෂණය කරයි.

- ISPs - අන්තර්ජාල සේවා සැපයුම්කරු යනු අන්තර්ජාල සේවාවන්ට සම්බන්ධ වීමට පහසුකම් සලසන ආයතනයකි.

අන්තර්ජාලය නොමිලයේ ලැබෙන සේවාවක් වුවද එහි සේවාවන් ලබා ගැනීම සඳහා අන්තර්ජාල සේවා සපයන ආයතනයක් සමඟ සම්බන්ධ විය යුතුය.ඒ සඳහා ISP ආයතන මුදල් අය කරයි.ශ්‍රී ලංකාව තුළ දුරකථන සම්බන්ධතා ලබා දෙන බොහෝ ආයතන අන්තර්ජාල සබඳතා ලබා දෙයි.

උදා - ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ,ඩයලොග් ආයතනය ,Airtel,Lankabell,Mobitel

**අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි තොරතුරු**

1.ලිපිලේඛන - E Books,Presentation,PDF,Tutorials

2.පින්තූර හා Graphic නිර්මාණ

3.ශබ්ද ගොනු හෝ වීඩියෝ දර්ශන

4.මෘදුකාංග

**අන්තර්ජාල සබඳතා ලබා දෙන ක්‍රමවේද**

1.රැහැන් සහිත

2. රැහැන් රහිත

**අභ්‍යාස**

1.අන්තර්ජාලය භාවිතා කිරීමේ වාසි හා අවාසි 4 බැගින් ලියන්න.